සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2013
-----------------------------------------------------------

සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (ටීආර්අයිපී) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංප්‍රසජ) සහ වර්තමානයේ, ජපන් ජාත්‍යන්තර සහයෝගික නියෝජිත ආයතනය (ජ.ජා.ස.ආ) යනුවෙන් හැඳින්වෙන ජාත්‍යන්තර සහයෝගීතාවය සඳහා වූ ජපන් බැංකුව (ජාස ජබැ) අතර 2006 මාර්තු 28 දින එළඹි අංක එස්එල්-පී 86 දරන ණය ගිවිසුමේ III ව්‍යස්ථාවේ 4(8) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය මෙහෙයවීමේ නියෝජිතායතනය වන අතර ක්‍රියාත්මක ප්‍රදේශ තුළ ඇති පළාත්පාලන ආයතන, බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ග සංවර්ධන අධිකාරිය, මධ්‍යම සංස්කෘතික අරමුදල සහ උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. කොළඹ, මහනුවර, මීගමුව, නුවරඑළිය, සීගිරිය හා අනුරාධපුරයෙහි සංචාරක සම්පත් යටිතල පහසුකම් හා මානව සම්පත් සංවර්ධනය සහ ජපානයේ අලෙවිකරණය හා ප්‍රවර්ධන කටයුතු තුළින් සංචාරකයින්ගේ සංඛ්‍යාව වැඩි කිරීම හා සංචාරක සංවර්ධනය මඟින් සමාජ හා ආර්ථික සංවර්ධනයට දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 3,128 ක් වන අතර එයින් රු.මිලියන 2,346 ක් එනම් සියයට 75 ක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2006 මාර්තු 28 දින ආරම්භ කළ අතර, 2012 දෙසැම්බර් වන විට නිම කිරීමට නියමිතව තිබුණද ව්‍යාපෘතියේ කටයුතු 2013 මැයි මාසයේදී නිමකර තිබුණි. 2013 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා ව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා නවයේ ඒකාබද්ධ වැඩසටහන් වාර්ෂික මූල්‍ය වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්

තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයන ලද නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව, වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) ආරම්භක සහ අවසාන ශේෂ, විශේෂ ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී.ලං.ම.බැ.) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමණාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව,

(එ)ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3.** **මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**4.1** **මූල්‍ය කාර්ය සාධනය**

**----------------------**

මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට ලබාගතහැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ වියදම රු.මිලියන 882 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 3700 ක් විය. සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘතියේ වියදම, ඉකුත් වර්ෂයේ ව්‍යාපෘති වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| -------------- | ------------------------------- | | ------------- |
| | 2013 | 2012 | |
| | ------ | ------ | |
| | රු.(මිලියන) | රු.(මිලියන) | රු.(මිලියන) |
| සිවිල් වැඩ හා උපකරණ ප්‍රසම්පාදනය | 451.60 | 186.10 | 2,177.97 |

| | | | |
|---|---|---|---|
| ධාරිතා වර්ධන වැඩ සටහන | 32.25 | 76.62 | 209.07 |
| ප්‍රජා සංවර්ධන වැඩසටහන | - | 7.75 | 28.65 |
| ජපානයේ සංචාරක අලෙවිකරණ හා ප්‍රවර්ධන වැඩ සටහන | 357.35 | 114.44 | 474.76 |
| උපදේශන සේවා | 7.00 | 0.37 | 337.45 |
| පොලී හා සේවා ගාස්තු | 10.55 | 25.51 | 83.09 |
| පරිපාලන | 23.25 | 43.32 | 389.33 |
| | -------- | ------- | ---------- |
| | 822.00 | 454.11 | 3,700.32 |
| | ===== | ===== | ====== |

4.2 විශේෂ ගිණුම
---------------

මූලාා ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශේෂ ගිණුමේ මෙහෙයුම් සහ 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය සාරාශ පහත දැක්වේ.

| | ජපන් යෙන් | රුපියල් |
|---|---|---|
| | -------------- | ---------- |
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 83,058,682 | 122,918,543 |
| ඌනපූර්ණයෙන් | 301,999,807 | 385,825,637 |
| | --------------- | ------------- |
| | 385,058,489 | 508,744,180 |
| අඩුකළා : | | |
| ආපසු ගැනීම් | 379,821,534 | 499,368,552 |
| ජා.ස.ජ.බැ වෙත ප්‍රතිපූර්ණය කිරීම් | 5,236,955 | 6,663,502 |
| විදේශ විනිමය අලාභ | - | 2,712,126 |
| | ----------- | ----------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | නැත | නැත |
| | ====== | ====== |

5. විගණන නිරීක්ෂණ
-------------------

5.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

(අ) ශේෂ පත්‍රයේ දක්වා තිබුණු වටිනාකම රු.416,038,327 වූ සිවිල් වැඩ මූලාා ප්‍රකාශනවල සටහන් යටතේ දක්වා තිබුණු ඊට අනුරූප වටිනාකම වූ රු.411,443,718 සමඟ නොවූ අතර රු.4,594,609 වූ වෙනස විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ජපන් ජත්‍යාන්තර සහයෝගිතා ආයතනය වෙත ප්‍රතිපූර්ණය කර තිබුණු ජපන් යෙන් 5,236,955 කට සමාන රු.6,663,502 ක් අතර, එය විදේශ විනිමය

අලාභයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා තිබුණි. එසේම, ශේෂ පත්‍රයේ දක්වා තිබුණු රු.368,883 ක විදේශ විනිමය අලාභයට අදාළ මොරගස්වැව - සීගිරිය මාර්ගය ඉදිකිරීම හා සම්බන්ධිත, විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) ශේෂ පත්‍රයෙහි ආයෝජන පිරිවැය යටතේ දක්වා තිබූ ප්‍රාග්ධනිත කළ ණය ගැණුම් පිරිවැය රු.23,021,845 ක් ද්විත්ව ගිණුම්කරණය නිසා රු.10,050,705 කින් වැඩියෙන් දක්වා තිබුණි.

6. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය
---------------------------------------

6.1 අරමුදල් උපයෝජනය
-------------------------

මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂයේ හා 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම යටතේ මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | | | | 2013 වර්ෂය තුළ | 2013 දෙසැම්බර් 31 දක්වා |
| | ජපන් යෙන් (මිලියන) | රුපියල් (මිලියන) | රුපියල් (මිලියන) | රුපියල් (මිලියන) | රුපියල් (මිලියන) |
| ජ.ජා.ස.නි. | 2,604 | 2,346 | 892.43 | 863.93 | 3,316.20 |
| ශ්‍රී.ල.ර. | 868 | 782 | 73.00 | 68.54 | 424.84 |
| | 3,472 | 3,128 | 965.43 | 932.47 | 3,741.04 |

2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණු රු. මිලියන 3,741.04 ක අරමුදල් එව දිනට ව්‍යාපෘතියේ සමුච්චිත වියදම වූ රු. මිලියන 3,700.32 ක මුදල සමඟ එකඟ නොවිණි. එසේම, සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණු රු. මිලියන 932.47 මුදලද සමාලෝචිත වර්ෂය තුළ වැයකළ බවට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. මිලියන 802 සමඟ එකඟ නොවිණි. කෙසේ වුවද, මෙම වෙනසට හේතු විගණනයේදී පැහැදිළි නොකෙරුණි.

6.2 භෞතික කාර්ය සාධනය
---------------------------

2012 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට සැලසුම්කර තිබුණු ව්‍යාපෘතියේ කටයුතු 2013 මැයි මාසයේදී අවසන්කර තිබුණි. කෙසේ වුවද, වටිනාකම රු.51,964,914 ක් වූ වත්කම් ආයතනවලට මාරු කිරීමට සහ රු.4,852,272 ක් වූ වගකීම් නිරවුල් කිරීමට පියවර නොගෙන දිගින් දිගටම 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.